මගේ අංකය / எனது இல / My Number } ME/E/2(සබර/ච)

ඔබේ අංකය / உமது இல / Your Number }

දිනය / திகதி / Date } 2016/11/29

**<u>පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක</u>**

**<u>සබර/2016/07</u>**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,සබරගමුව

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම විෂය භාර අධ්‍යක්ෂවරුන්,

සියලුම ගණකාධිකාරිවරුන්,

විදුහල්පතිවරු.

**<u>විදුහල්පතිවරුන් ගුරුවරුන් හා අධ්‍යාපන නිලධාරීන්ගේ රාජකාරී කාලය ඵලදායීව, කාර්යක්ෂමව යොදා ගැනීම සම්බන්ධව සබරගමුව පළාත් ගිණුම් කාරක සභාවේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම</u>**

විදුහල්පතිවරුන් හා ගුරුවරුන් නිසි වේලාවට පාසලේ රාජකාරී කටයුතු සඳහා වාර්තා නොකිරීම, තම තමන්ට අදාල ඉගෙනුම් කාල පරිච්ඡේද ඵලදායී ලෙස යොදා නොගැනීම යන කාරණා බොහෝ පාසල්වල විද්‍යාමාන වන බව පාසැල් නිරීක්ෂණ හා විගණන විමසුම්වලින් අනාවරණය වේ. මේ සම්බන්ධව 2016/11/01 දින පළාත් සභාවේ අධ්‍යාපන ගිණුම් කාරක සභාවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් වන ලදී. එම තත්ත්වය තුළ පාසල් දරුවන්ගේ අධ්‍යාපනයට විශාල බාධාවක් මෙන්ම අසාධාරණයක්ද වන බව තීරණය විය. නියමිත වේලාවට පාසලේ සේවයට වාර්තා නොකිරීම හා අදාල ඉගෙනුම් කාල පරිච්ඡේද නියමිත පරිදි සම්පූර්ණ නොකිරීම තුළ එම අත්‍යවශ්‍ය වූ ඉගෙනුම් කටයුතු නැවත පාසල් දරුවන්ට ලබා දීම ප්‍රායෝගිකව ඉතා අපහසු වේ.

02 එබැවින් මින් ඉදිරියට විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ සේවයට වාර්තා කිරීම හා නියමිත ඉගෙනුම් කාල පරිච්ඡේද සම්පූර්ණ කිරීම, නියමිත සේවා කාලය සම්පූර්ණ කර පාසලෙන් බැහැර වීම, පාසැල් කාලය තුළ

බැහැර රාජකාරී සඳහා පාසලෙන් පිටව යෑම යන කරුණුත්, විශේෂයෙන් ගුරුවරුන් සඳහා පවත්වනු ලබන සේවස්ථ ගුරු සැසි, පුහුණු වැඩමුළු, රැස්වීම් ආදිය දරුවන්ගේ අධ්‍යාපනයට බාධා වන පරිදි පාසල් කාලය තුළ යොදා ගැනීම සීමා කිරීම, විශේෂයෙන් ගුරුවරුන් සඳහා කලාප,කොට්ඨාස, පළාත් මට්ටමින් යොදා ගන්නා එවැනි වැඩසටහන් හැකිතාක් වර්ෂයේ පළමු කාර්තුව තුළ අවසන් කිරීමට කටයුතු කිරීම කළ යුතුය. විශේෂයෙන් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වෙන අවසන් වාරය, උසස් පෙළ හා ශිෂ්‍යත්ව විභාග පැවැත්වෙන දෙවන වාරය තුළ විවිධ අධ්‍යාපනයට සමගාමී හෝ බාහිර වැඩ යොදා ගැනීම තුළින් සිසු දරුවන්ගේ අධ්‍යාපනයට බාධාවන් සිදු වේ. එම කාලය තුළ අත්‍යවශ්‍යයෙන්ම යොදා ගත යුතු වැඩසටහන් වේ නම් පාසල් කාලයෙන් පසුව සවස් වරුවේ හෝ සති අන්තයේ නිවාඩු දිනවලදී යොදා ගැනීම වඩාත් යෝග්‍ය වේ.

03 එමෙන්ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විෂය අධ්‍යක්ෂවරු එකවර පළාත් දෙපාර්තමේන්තුව මගින් මසකට කිහිප අවස්ථාවක් රැස්වීම්, වැඩමුළු සඳහා කැඳවීම සීමා කළ යුතු වේ. ඒ සඳහා මසකට එක් දිනක් සියලුම අංශවලින් අදාලව ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා පමණක් කැඳවීම් කිරීමට කටයුතු කළ යුතුය. 2017 වර්ෂය තුළ රජයේ අනවශ්‍ය වියදම් අවම කිරීමේ නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින් අත්‍යවශ්‍ය වැඩසටහන් සඳහා පමණක් මුදල් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු කිරීම ඉතා වැදගත් වන අතර අත්‍යවශ්‍ය රාජකාරී සඳහා පළාත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අධ්‍යක්ෂවරුන් කලාපවලට යාම වඩා ඵලදායී වේ.

04 පාසල්වල නියමිත වෙලාවට ගුරුවරුන්ගේ පැමිණීම, අදාල කාල පරිච්ඡේද උපරිම ඵලදායී ලෙස යොදවා ගැනීම, පාසලෙන් ගුරුවරු බැහැර වීම යන කරුණු අධීක්ෂණය සඳහා විදුහල්පතිවරු පෞද්ගලිකවම තම අධීක්ෂණයට නියාමනයට කටයුතු කළයුතු අතර මේ සඳහා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට රාජකාරී පවරා අවශ්‍ය බලතල පැවරීම කළ යුතුය.

05 එමෙන්ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන්, පාසල් අධීක්ෂණය හා කණ්ඩායම් පරීක්ෂණ නිසි ක්‍රමවේදයන් අනුව ක්‍රියාත්මක කළයුතු අතර එකී අධීක්ෂණයෙන් අනාවරණය කරගත් කරුණු සම්බන්ධව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසින් මාසික වාර්තාවක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කිරීම 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතුය. මේ සම්බන්ධව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ දැඩි අධීක්ෂණය හා විශේෂ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

06 ඉහත උපදෙස් තරයේ පිළිපදින ලෙස මින් අවධාරණය කරමි.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

Ministry of Provincial Education
Sabaragamuwa

මහින්ද එස්.වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

පිටපත් : 01 ප්‍රධාන ලේකම් - සබරගමුව පළාත් සභාව - දැ.පි.
02 පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - දැ.පි
03 සහකාර විගණකාධිපති - සබරගමුව පළාත් සභාව - දැ.පි.
04 අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - සබරගමුව පළාත් සභාව - දැ.පි.
05 විගණන අධිකාරී - රත්නපුර/කෑගල්ල - දැ.පි.